පුවතක් වාර්තා කිරීමේදී, එයට සම්බන්ධ අයෙකුගේ ජාතිය හෝ ජාතිකත්වය, අවඥාසහගතව හෝ අගතිකාරී අන්දමින් දැක්වීම කෙතරම් යෝග්‍ය වන්නේ ද යන කාරණාව, Ethics Eye අපි මින් පෙරද අසා ඇත්තෙමු.
මාධ්‍ය විසින් සිදුකරන එවැනි දැක්වීම් වලට හොඳම නිදසුනක් වන්නේ, විශේෂයෙන්ම සෘණාත්මක පසුතලයන් තුළ දී, චීන ජාතිකයින් හැඳින්වීමට "චීනා" වැනි යෙදුම් භාවිත කිරීමයි.
එයට උදාහරණයක් ලෙසට, ව්‍යාජ ගමන් බලපත්‍රයකින් මෙරටට පැමිණි චීන ජාතිකයෙකු පිළිබඳව, පුවත් වාර්තාවන් සතරක් (මැයි 23, 2023) තුළ සඳහන් වී ඇති ආකාරය විමසා බැලිය හැක.
* අද, දිනමිණ, මව්බිම - "චීන ජාතිකයා"
* අරුණ - "චීනා"
ඔබ සිතන ලෙසට,
1) සෘණාත්මක පසුතලයක් තුල "චීනා" වැනි යෙදුමක් අවඥාසහගත, අවමානාත්මක, ගර්හාව ඇති කරවන සුළු නොවන්නේ ද? ඒ ඔස්සේ, පොදුවේ චීන ජාතිකයින් කෙරෙහි අවමානාත්මක, කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ මුල් බැස ගැනීමට අනුබලයක් නොලැබෙන්නේ ද?
2) ඒ අනුව, "චීනා" වැනි යෙදුම් දිගින් දිගටම භාවිතා කිරීම ඔස්සේ, චීන ජාතිකයින් කෙරෙහි විදේශ භීතිකාවක් (xenophobia) පවා ඇති විය නොහැකි ද?
3) එසේ නම්, වඩාත් යෝග්‍ය වාර්තාකරණයන් ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන පුවත් වාර්තාවන් ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

